# 4. කර්මාන්ත

## 4.1 සමස්ත උපනතීන්

මාර්තු මස අවසානයේ සිට වසරේ තුන්වන කාර්තුව අවසානය දක්වා දීර්ඝ කාලයක් තුළ පැවැති විදුලි බලය කපා හැරීමේ අහිතකර ප්‍රතිවිපාක මධ්‍යයේ වුවද 1996 වර්ෂයේදී කාර්මික නිෂ්පාදනය සියයට 7.3 කින් වර්ධනය විය. 1995 වර්ෂයේදී මීට සාපේක්ෂව ලබාගත් වර්ධන වේගය සියයට 10.2 ක් විය. පෞද්ගලික අංශය මගින් විදුලිය උත්පාදනය උනන්දු කිරීම සඳහා සපයන ලද ආනයන බදු සහන, ජාතික සංවර්ධන බැංකුව මගින් සහ සංවර්ධන මූල්‍ය සමායතනය මගින් විදුලි උත්පාදන යන්ත්‍ර ආනයනය කිරීම සඳහා සපයන ලද විශේෂ ණය පහසුකම් සහ පෞද්ගලික අංශය මගින් උත්පාදනය කරන ලද විදුලිය ජාතික විදුලි බල පද්ධතිය සඳහා වැඩි මිළකට මිළදී ගැනීම මගින් වක්‍ර ආකාරයෙන් සපයන ලද සහනාධාර වැනි ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් විදුලිය කපා හැරීම හේතුවෙන් කාර්මික නිෂ්පාදනයට සිදු වූ අලාභය අඩුකර ගැනීමට හැකි විය. විදුලි බලය කපා හැරීම අඩුවෙන් සිදුවූ අපනයන සැකසීමේ කලාපවල කාර්මික නිෂ්පාදනයේ සිදුවූ වැඩිවීම 1996 වර්ෂයේ කාර්මික නිෂ්පාදන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. රාජ්‍ය අංශයේ සහ ඛනිජ තෙල් පිරිපහදුව බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහ අපනයන සැකසුම් කලාප වලින් පිටත පෞද්ගලික අංශයේ කර්මාන්තවල කාර්මික නිෂ්පාදනයේ සිදු වූ සාමාන්‍ය වර්ධනයද සමස්ත කාර්මික නිෂ්පාදනය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී. නිමැවුම් කර්මාන්ත නිෂ්පාදනයෙන් සියයට 83 කට පමණ දායක වූ කම්හල් නිමැවුම් 1996 වර්ෂයේ ආර්ථික වර්ධනයෙන් සියයට 33 කට දායක විය.

ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති ආයතනවල දැනට කර ඇති ආයෝජනවල සිදු වූ කැපී පෙනෙන වර්ධනය අපනයන පෙරදැරි කරගත් කර්මාන්තවල වර්ධනය කෙරෙහි විශාල වශයෙන් දායක විය. එමෙන්ම ඇ. එ. ජ. සහ අනෙකුත් බටහිර රටවල ඉල්ලුමෙහි සිදුවූ වර්ධනයද අපනයන පෙරදැරි කරගත් කර්මාන්ත වල වර්ධනය සඳහා උපකාරී විය. කෙසේ වෙතත් 1996 වර්ෂයේදී කාර්මික නිෂ්පාදනයේ සිදුවූ තාවකාලික පසුබැසීම හේතුවෙන් මෙම වාසිය සම්පූර්ණ වශයෙන් ලබාගැනීමට නොහැකි විය. ශ්‍රී ලංකා රුපියලේ සිදුවූ සාමාන්‍ය අවප්‍රමාණය වීමද අපනයන අංශය සඳහා උපකාරී විය. පෙර වර්ෂය සමග සසඳන කළ 1996 වර්ෂයේදී කම්කරු ආරවුල් ප්‍රමාණය අඩු මට්ටමක පැවැතින. ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම තවදුරටත් කර්මාන්ත අංශයේ ඉහළ වර්ධනය සඳහා ප්‍රධාන බාධාවක් විය.


## 4.2 නිෂ්පාදනය

1996 වර්ෂයේදී ඇස්තමේන්තු කරන ලද සියයට 7.3 ක සමස්ත කාර්මික නිෂ්පාදන වර්ධනය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත 460 ක් ආවරණය වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද කාර්මික නිෂ්පාදනය පිළිබඳ වාර්ෂික සමීක්ෂණ දත්තයන්, රාජ්‍ය අංශයේ නිෂ්පාදන දත්තයන් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ඇති කර්මාන්තවල අපනයන දත්තයන් ඇසුරෙන් කරන ලද ඇස්තමේන්තු මත පදනම් විය. කාර්මික නිෂ්පාදනය වර්තමාන මිළ ගණන් වලට අනුව සියයට 17.5 කින් වැඩි විය. මේ අනුව කම්හල් නිමැවුම් සඳහා වන ගම්‍ය මිළ දර්ශකය සියයට 9.5 ක් වේ.


රූප සටහන 4.1

**කාර්මික නිෂ්පාදන වර්ධනය සහ සංයුතිය**

රූප සටහන 4.1.1




රූප සටහන 4.1.2



**සංඛ්‍යා සටහන 4.1**
**කර්මාන්ත අංශයේ නිෂ්පාදන වටිනාකම**
**(1990 ස්ථාවර මිල අනුව)**

| කාණ්ඩය | රුපියල් දශ ලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) | 1995 | 1996 (අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 26,087 | 28,304 | 30,445 | 33,641 | 35,908 | 10.5 | 6.7 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 38,805 | 45,540 | 48,333 | 55,480 | 58,332 | 14.8 | 5.1 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 797 | 939 | 1,085 | 1,243 | 1,321 | 14.5 | 6.2 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,628 | 3,140 | 3,565 | 3,508 | 3,550 | -1.6 | 1.2 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 19,752 | 23,683 | 25,838 | 27,543 | 31,135 | 6.6 | 13.0 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 9,451 | 10,349 | 11,643 | 12,561 | 13,360 | 7.5 | 6.7 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,294 | 1,178 | 1,568 | 1,377 | 1,636 | -12.2 | 18.8 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5,314 | 5,203 | 5,931 | 6,139 | 6,252 | 3.5 | 1.8 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 2,124 | 2,366 | 2,617 | 3,005 | 3,443 | 14.8 | 14.5 |
| එකතුව | 106,252 | 120,702 | 131,025 | 144,452 | 154,936 | 10.2 | 7.3 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**සංඛ්‍යා සටහන 4.2**
**පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන දර්ශකය**

**1990 =100**

| කාණ්ඩය | | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) | 1995 | 1996 (අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 120 | 129 | 140 | 155 | 166 | 10.4 | 6.9 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 144 | 168 | 179 | 206 | 217 | 14.8 | 5.1 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 106 | 123 | 149 | 170 | 165 | 14.1 | -2.8 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 184 | 226 | 263 | 266 | 279 | 1.0 | 4.7 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 121 | 132 | 159 | 196 | 224 | 23.6 | 14.2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 137 | 159 | 212 | 228 | 243 | 7.5 | 6.7 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 167 | 225 | 266 | 305 | 351 | 15.0 | 15.2 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 126 | 124 | 141 | 147 | 150 | 3.9 | 1.8 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 127 | 152 | 168 | 193 | 221 | 14.8 | 14.5 |
| එකතුව | 137 | 155 | 172 | 192 | 205 | 12.1 | 6.9 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

1996 වර්ෂයේදී කාර්මික නිෂ්පාදන වර්ධනය රසායන ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත; රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ යන ප්‍රධාන කාර්මික කාණ්ඩයන් මගින් ජනිත විය. මෙම කාර්මික කාණ්ඩයන් තුන සමස්ත කාර්මික නිෂ්පාදන වර්ධනයෙන් සියයට 83 කට දායක විය.

## පෞද්ගලික අංශයේ කර්මාන්ත

1995 වර්ෂයේදී ලබාගත් සියයට 12.1 ක වර්ධනයෙහි සමග සසඳන කල, 1996 වර්ෂයේදී පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදනය සියයට 6.9 කින් වර්ධනය වී ඇති බව ඇස්තමේන්තු කොට ඇති අතර, පෞද්ගලික අංශයේ කර්මාන්ත මුළු කාර්මික නිෂ්පාදනයෙන් සියයට 90 කට දායක විය. පෞද්ගලික අංශයේ කර්මාන්තවල මෙම වර්ධනය ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත වල සියයට 10.1 ක වර්ධනයෙහි සහ ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තවල සියයට 3.7 ක වර්ධනයෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තවල වර්ධනය කෙරෙහි රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත සහ රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල් රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් දායක විය. ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තවල වර්ධනය ආහාර, පාන වර්ග සහ දුම්කොළ සහ මූලික ලෝහ භාණ්ඩ යන නිෂ්පාදන කාණ්ඩයන් මගින් ප්‍රධාන වශයෙන් පිළිබිඹු විය.

## රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදන

1995 වර්ෂයේදී ලබාගත් 14.8 වර්ධන වේගය හා සසඳන කළ රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩය 1996 වර්ෂයේදී මූර්ත වශයෙන් සියයට 5.1 කින් වර්ධනය විය. මෙය ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තයන්හි සියයට 6.0 ක සහ ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තයන්හි සියයට 1.7 ක වර්ධනයක ප්‍රතිඵලයකි. 1996 දී තරමක අඩු වර්ධනයක් පෙන්නුම් කළද මෙම කාණ්ඩය සමස්ත කාර්මික නිෂ්පාදනයෙන් සියයට 39.0 කට දායක වූ අතර පෞද්ගලික අංශයේ කාර්මික නිමැවුම් වර්ධනය සඳහා සියයට 33.7 කින් දායක විය.

ඇමරිකා එක්සත් ජනපදය වෙත කරන ලද සමස්ත රෙදිපිළි, සහ ඇඟළුම් අපනයනය ප්‍රමාණාත්මක වශයෙන් 1995 දී වර්ග මීටර සමානුපාතික (ව.මී.ස.) දශලක්ෂ 398 සිට 1996 දී ව.මී.ස. දශලක්ෂ 427 දක්වා සියයට 7.3 කින් වර්ධනය විය. ඇමරිකා එක්සත් ජනපදයට කරන ලද මුළු රෙදිපිළි සහ ඇඟළුම් අපනයන වල වටිනාකම සියයට 11.1 කින් වර්ධනය විය. 1996 දී ඇමරිකා එක්සත් ජනපද වෙළඳපොල වෙත පංගු ක්‍රමය යටතේ අපනයනය කරන ලද ඇඟළුම් ප්‍රමාණාත්මක වශයෙන් සියයට 6.5 කින් වර්ධනය වූ අතර පංගු නොවන ඇඟළුම් අපනයනය සියයට 12.1 කින් පහත වැටුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ 1996 මුහුණදුන් දුෂ්කර කාලපරිච්ඡේදය තුළදී අපනයනකරුවන් අවම වශයෙන් පංගු ක්‍රමය යටතේ පැවැති ගිවිසුම් කඩ නොවන පරිදි පවත්වාගෙන යාමට කටයුතු කිරීම වේ. පංගු ක්‍රමය යටතේ ඇඟළුම් නොවන අපනයනද සියයට 8.8 කින් වැඩි විය. 1996 දී පංගු ක්‍රමය යටතේ ඇමරිකා එක්සත් ජනපද වෙළෙඳපොල වෙත කරන ලද අපනයන ප්‍රමාණය සමස්ත ඇඟළුම් අපනයනයෙන් සියයට 76 ක් විය.

සේවා නියුක්ති අවස්ථා 251,537 ක් සපයා ඇත. ඇඟළුම් කම්හල් 200 වැඩසටහන යටතේ ආරම්භ කරන ලද කම්හල් වලින් 154 ක් වර්ෂය තුළදී වාණිජමය නිෂ්පාදන කටයුතුවල නිරත වූ අතර ප්‍රධාන වශයෙන් කළමණාකරන ගැටළු හේතුවෙන් කම්හල් 6 ක් වසා දමා හෝ වෙනත් ආයතනයන් සමග ඒකාබද්ධ වී ඇත. පෙර වසරේදී මෙන්ම පුද්ගලයින් 76,821 ක් මෙම ඇඟළුම් කම්හල් 154 හි සේවයෙහි නියුක්ත වූහ. 1996 දී මෙම කම්හල්වල ඇස්තමේන්තුගත අපනයන ඉපයීම රුපියල් දශලක්ෂ 44,659 ක් වූ අතර එය පෙර වසරට වඩා රුපියල් දශලක්ෂ 4,300 ක වර්ධනයකි.

සමස්ත රෙදිපිළි නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයකට හිමිකම් කියන විශාල ප්‍රමාණයේ ආයතන 10 ක් සමග රෙදිපිළි නිෂ්පාදන ආයතන 140 ක් රටෙහි පැවතිණ. පසුගිය වර්ෂයේදී මෙන්ම 1996 වසරේදීද පෙර පැවැති බදු ආරක්ෂණය යටතේ ආරම්භ වූ දේශීය වෙළෙඳපොල සඳහා නිෂ්පාදනයකළ කර්මාන්තකරුවන් ආනයන තරගකාරීත්වය හමුවේ වෙළෙඳපොල ගැටළු වලට මුහුණ දීමට සිදුවීමෙන් තවදුරටත් දුෂ්කරතාවලට පත්වූ අතර අපනයන මුල් කරගත් රෙදිපිළි නිෂ්පාදකයන්,

**සංඛ්‍යා සටහන 4.3**
**කාර්මික නිෂ්පාදන වටිනාකම**
**(පවත්නා මිල ගණන් අනුව)**

| කාණ්ඩය | රුපියල් දශ ලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) | 1995 | 1996 (අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 34,157 | 39,709 | 45,054 | 54,927 | 68,209 | 21.9 | 24.2 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 53,929 | 70,057 | 78,211 | 89,944 | 101,627 | 15.0 | 13.0 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 1,005 | 1,230 | 1,601 | 1,929 | 2,171 | 20.5 | 12.5 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,586 | 3,438 | 4,066 | 4,595 | 5,069 | 13.0 | 10.3 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 23,817 | 28,876 | 34,017 | 38,321 | 46,936 | 12.7 | 22.5 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 10,582 | 12,351 | 14,580 | 16,740 | 18,997 | 14.8 | 13.5 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,424 | 1,497 | 1,909 | 1,736 | 2,248 | -9.1 | 29.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5,948 | 5,915 | 7,122 | 7,977 | 8,807 | 12.0 | 10.4 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 2,658 | 3,402 | 4,083 | 5,271 | 6,183 | 29.1 | 17.3 |
| එකතුව | 136,106 | 166,475 | 190,643 | 221,440 | 260,247 | 16.2 | 17.5 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සාර්ථක ලෙස නිෂ්පාදන කටයුතුවල නිරතවිය. දේශීය ඇඟළුම් අපනයන කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමට තරම් ආකර්ශනීය වීමට නම් දේශීය රෙදිපිළි වල ගුණාත්මක වර්ධනයක් කළ යුතුව ඇත. රටෙහි ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වලින් දේශීය රෙදිපිළි නිෂ්පාදනයට සැපයීමට හැකිව ඇත්තේ සියයට 10 කට අඩු ප්‍රමාණයක් පමණි.

1996 දී ඇමරිකා එක්සත් ජනපදය හා යුරෝපීය සංගමයේ රටවල් මෙන්ම කැනඩාවෙන් ලැබුණු පංගු ප්‍රමාණයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. ගොතන ලද කමිස සහ හැට්ට, දිග කලිසම්, යට ඇඳුම්, කබා සහ ආවරණ කබා, තුවා සහ අනෙකුත් සිනිඳු තුවා වැනි පංගු කාණ්ඩයන්හි එක්සත් ජනපද වෙළෙඳපොල පංගු උපයෝජන අනුපාතිකය සියයට 100 ක් කරා ලඟා වීමට හැකි විය. පිරිමි සහ පිරිමි ළමුන්ගේ සූට් කබා, ගැහැණු සහ ගැහැණු ළමුන්ගේ සූට් සහ ස්වීටර්ස් යන කාණ්ඩයන්හි වාර්තා වූ පංගු උපයෝජන අනුපාතිකය පෙර වසර වලදී මෙන්ම පහත මට්ටමක පැවතිණ. යුරෝපා සංගමයට අයත් පංගු වලින් වඩාත් ජනප්‍රිය කාණ්ඩයන් වූයේ ගැහැණු සහ ගැහැණු ළමුන්ගේ වියන ලද සහ ගොතන ලද හැට්ට, කාන්තා දිග කලිසම් සහ කාන්තා කොට කලිසම් ය. 1996 දී සමහර කාණ්ඩයන්හි (වියනලද විවිධ වර්ගයේ උණුසුම් ඇඳුම්) පංගු උපයෝජනයෙහි පහත වැටීමක් පෙන්නුම් කළේය.

1995 ජනවාරි මාසයේදී ජගත් වෙළෙඳ සංවිධානය (ජ.වෙ.සං) ඇරඹීමත් සමගම 'බහුවිධ කෙඳි සැකසුම' යටතේ පවත්නා සියළුම ද්විපාර්ශවික ගිවිසුම් වර්ෂ 2005 වන විට ඉවත් කිරීමට නියමිතය. වසර 2005 වන විට රෙදිපිළි සහ ඇඟළුම් අංශයෙහි පංගු ක්‍රමයෙන් තොරව නිදහස් වෙළඳාමක් ආරම්භ කිරීමට හැකිවන අයුරින් පංගු ක්‍රමය අවස්ථා හතරකදී එනම් 1995 දී සියයට 16 කින්ද, 1998 දී සියයට 17 කින්ද, 2002 දී සියයට 18 ක් සහ ඉතිරි සියයට 49, වසර 2004 අවසානයේදී ද ඉවත් කිරීමට බලාපොරොත්තු වේ. වර්තමාන පංගු ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන ශ්‍රී ලංකාවද ඇතුළුව දියුණු වෙමින් පවත්නා අනෙකුත් රටවල් නුදුරු අනාගතයේදී ඇතිවිය හැකි තරගකාරී වෙළෙඳපල පරිසරයට සාර්ථක

කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයට අනුව 1996 වර්ෂය අවසානය වන විට ඇඟළුම් කම්හල් 845 ක් විය. මෙම කම්හල් මගින් සෘජු

ලෙස මුහුණදීමට හැකිවන පරිදි රෙදිපිළි කර්මාන්තය තුළ ව්‍යුහාත්මක වෙනස්කම් කිරීම අවශ්‍ය වේ.

## ආහාර, පාන වර්ග සහ දුම්කොළ

මෙම කාණ්ඩය පෙර වසරේදී ලබාගත් සියයට 10.4 ක් වූ වර්ධනය හා සසඳන කළ 1996 දී සියයට 6.9 කින් වර්ධනය වූ අතර සමස්ත කාර්මික නිමැවුමින් සියයට 27.1 කට දායක විය. එමෙන්ම මෙම නිෂ්පාදන කාණ්ඩය පෞද්ගලික අංශයෙහි කාර්මික නිමැවුම් වර්ධනයෙන් සියයට 26.9 කට දායක විය. සකස් කළ දුම්කොළ හා සිගරැට්, සීටීසී තේ (කපා, ඉරා, අඹරන ලද) සහ තේ මලු, බීර සහ මත්පැන්, කිරි නිෂ්පාදන, සකස් කළ පොල් සහ මස් නිෂ්පාදනයන්හි කැපී පෙනෙන නිමැවුම් වර්ධනයක් දැකිය හැකි විය. සිගරැට් මත පනවන ලද ඉහළ බදු තත්වයන් යටතේ පවා සකස්කළ දුම්කොළ නිෂ්පාදනය සියයට 5.7 කින් වර්ධනය විය. ප්‍රධාන පෙලේ නිෂ්පාදකයන් සතුව විදුලිබල උත්පාදන යන්ත්‍ර තිබීමේ හේතුවෙන් දුම්කොළ සැකසීමේ කර්මාන්තයට විදුලිබල මණ්ඩලයේ වැඩ වර්ජනය සහ විදුලිබලය කපා හැරීමෙන් අහිතකර බලපෑමක් ඇති නොවුනි. 1995 නොවැම්බර් මාසයේදී බීර මත පනවා තිබූ බදු අඩු කිරීමෙන් ඉහළ ගිය ඉල්ලුමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය බීර නිෂ්පාදනය ඉහළ නැංවිණි. දේශීය ඉල්ලුම ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් මත්පැන් හා ස්ප්‍රීත්තු නිෂ්පාදනයෙහි සැලකියයුතු වර්ධනයක් 1996 වර්ෂයේදී වාර්තා විය. 1996 දී තේ සැකසීම් ආශ්‍රිත කර්මාන්ත වල සිදුවූ වර්ධනයට ඉවහල් වූයේ තේ නිෂ්පාදන මට්ටම ඉහල යාම සහ තේ සඳහා පැවති ඉහළ මිල ගණන් වේ. විදුලිබලය කපා හරින ලද කාලයේදී අපහසුතා වලට මුහුණ දුන් මස් සැකසීම ආශ්‍රිත කර්මාන්ත වල නිෂ්පාදනය වසරේ දෙවන භාගයේදී මුළුමනින්ම යථා තත්ත්වයට පත් විය. මාළු මිළ ඉහළ මට්ටමක පැවති හෙයින් සකස් කළ මස් නිෂ්පාදන සඳහා ඉහල ඉල්ලුමක් පැවතුනි. තිරිඟු පිටි සහනාධාරය ඉවත් කිරීමෙන් පසු තිරිඟු පිටි මිළගණන් ඉහළයාම නිසා පාන් සඳහා වූ ඉල්ලුම සහ තිරිඟු පිටි නිෂ්පාදනය අඩුවිය. නියගය හා විදුලිබලය කපා හැරීමේ හේතුවෙන් වසරේ ප්‍රථම භාගය තුළදී දැඩි පසුබෑමකට ලක්වූ පළතුරු සහ එළවළු සැකසීමේ කර්මාන්තය සඳහා ඉහළ දේශීය ඉල්ලුමක් පැවතුන ද එයට වර්ෂය තුළදී මුළුමනින්ම යථා තත්වයට පත්වීමට නොහැකි විය. 1995 දී සාමාන්‍ය වර්ධනයක් වාර්තා කළ කුකුළු කෑම නිෂ්පාදනය, විදුලිබලය කපා හැරීමේ කාලපරිච්ඡේදය තුළදී කුකුළු පාළනයෙහි යෙදී සිටින්නන් මුහුණ දුන් ගැටළු හේතුවෙන් 1996 දී පහත වැටුණි.

## රසායනික, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන

පසුගිය වර්ෂය හා සසඳා බලන කල සියයට 23.6 කින් වර්ධනය වූ පෞද්ගලික අංශයේ රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි නිෂ්පාදන වටිනාකම 1996 දී සියයට 14.2 කින් වර්ධනය විය. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් ආයෝජන මණ්ඩලයේ කර්මාන්තයන්ගෙන් ජනිත විය. විශේෂයෙන් මැදපෙරදිග රටවල් සහ යුරෝපා හවුලේ රට වලින් පැවති ආනයනික ඉල්ලුම ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, ටයර්, ටියුබ්, රබර් වළලු, අත්වැසුම්, කුඩා අත්වැසුම්, පීවීසී වැහිකබා, කෘතිම මලු වැනි රබර් නිෂ්පාදන සැලකිය යුතු ලෙස වර්ධනය විය. 1996 දී දේශීය වෙළෙඳපොලෙහි රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ ඉල්ලුමද පුළුල් විය. රබර් ආශ්‍රිත කර්මාන්තයන්හි නියැලි ප්‍රධාන ආයතන 15 ක අමුද්‍රව්‍ය වශයෙන් දේශීය රබර් භාවිතය 1996 වර්ෂයේදී සියයට 20 කින් වර්ධනය විය. දේශීය ඉල්ලුම ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් පොලි බෑග්, ගොතන ලද පොලි පොප්ලින් වැනි ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. කර්මාන්ත මූලයන්ට අනුව, දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද ඖෂධ වල තත්වය වැඩිදියුණුවීම හේතුවෙන් ඖෂධ කර්මාන්තයෙහි සැලකියයුතු වර්ධනයක් පෙන්නුම් කළේය. දේශීය සබන් හා සනීපාරක්ෂක නිෂ්පාදනවල මිල ගණන් ආයාත භාණ්ඩවල මිල ගණන් වලට වඩා පහලින් පැවතීම නිසා එම නිෂ්පාදන වල සැලකියයුතු වර්ධනයක් වාර්තා විය. ඵලදායී වෙළඳ ප්‍රචාරණ කටයුතු සහ භාණ්ඩවල උසස් ගුණාත්මක භාවය මෙම භාණ්ඩවල දේශීය ඉල්ලුම වැඩි වීමට හේතු විය.


## අනෙකුත් කාර්මික නිෂ්පාදන

ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩය 1996 වසර තුළ සියයට 6.7 ක වර්ධනයක් ලබා ඇත. ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තයන්හි, ඔප දැමූ පිඟන් ගඩොල්, පෝසිලේන් ප්‍රතිමා, මැටි භාණ්ඩ, සකස් කළ සිලිකා සහ කුට්ටි කරන ලද කළුගල් නිෂ්පාදනයේ සිදුවූ වර්ධනය තුළින් මෙය පිළිබිඹු වේ. පිඟන් ගඩොල් නිෂ්පාදන, වහල සෙවිලි කිරීමේ නිෂ්පාදන සහ සිමෙන්ති නිෂ්පාදනයද, දේශීය ඉදිකිරීමේ කර්මාන්ත තුළින් ඇති වූ ඉහළ නැගී දේශීය ඉල්ලුම සපුරාලිය හැකි වන පරිදි වර්ධනය විය. කම්කරු ආරවුල් සහ දියමන්ති නිෂ්පාදන කර්මාන්ත කිහිපයක සේවකයන් ස්වේච්ඡාවෙන් ඉවත්ව යෑම නිසා ඇතිවූ කම්කරු හිඟය හේතුකොට ගෙන දියමන්ති කර්මාන්තයෙහි තාවකාලික පසුබෑමක් ඇති විය. සකස් කළ ලෝහ නිෂ්පාදන කාණ්ඩයෙහි නිමැවුම් වර්ධනය ආයෝජන මණ්ඩලයට අයත් විද්‍යුත් හා විදුලි උපාංග සහ ප්‍රවාහන උපකරණ යන නිෂ්පාදන වල වර්ධනය තුළින් පිළිබිඹු වේ. ආයෝජන මණ්ඩලයට අයත් නොවන කෘෂිකාර්මික හා විදුලි යන්ත්‍රෝපකරණ, කේබල් සහ ලෝහ නිෂ්පාදිත වල සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. කේබල් සහ ලෝහ නිෂ්පාදන අංශයේ වර්ධනයට ඉදි කිරීම් කර්මාන්තයේ සිදුවූ වර්ධනය ඉවහල් විය. කෙසේ වුවද බස් සහ ලොරි බොඩි සකස් කිරීම, ශීතකරණ සහ විදුලි බුබුළු වැනි කර්මාන්ත ආනයනිත භාණ්ඩවල තරගකාරිත්වය හමුවේ සැලකිය යුතු


රූප සටහන 4.2

කාර්මික නිෂ්පාදන වටිනාකම් 1992 - 1996

(1990 - ස්ථාවර මිල ගනන් අනුව )



රූප සටහන 4.3
කාර්මික අපනයන ඉපයුම්
(1990 - ස්ථාවර මිල ගනන් අනුව)




පසුබෑමකට ලක් විය. ආනයන තරගකාරීත්වය හැරුනුකොට රජයේ ඇණවුම් පහත වැටීම සහ පුද්ගලික අංශයේ ඉල්ලුම අඩුවීමද බස් සහ ලොරි බොඩි සැකසුම තියුණු පසුබෑමකට ලක් කිරීමට හේතු විය.

කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන අංශයෙහි වූ සාමාන්‍ය වර්ධනය සඳහා ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තවල ඉහළ නිෂ්පාදන මට්ටම් හේතු විය. අභ්‍යාස පොත්, ලේබල් සහ රැලි සහිත කාඩ්බෝඩ් පෙට්ටි වැනි දේශීය වෙළඳපොල අරමුණු කොටගත් කඩදාසි නිෂ්පාදනවල පසුබෑමට ආනයන තරගකාරීත්වයද බලපාන ලදී. දැව සඳහා ආනයන බදු මුළුමනින්ම ඉවත් කිරීමේ සහ දැව මුල්කොට ගත් කර්මාන්ත සඳහා වූ පිරිවැටුම් බද්ද සියයට 20 හි සිට සියයට 6 දක්වා අඩු කිරීමේ තත්වයන් යටතේ පවා දැව නිෂ්පාදන කාණ්ඩයෙහි නිෂ්පාදිතය 1996 වසර තුළ පහත වැටුණි. දේශීය දැව සැපයුමේ පැවති හිඟයද කර්මාන්තයට අහිතකර ලෙස බලපෑවේය.

ආයෝජන මණ්ඩලයට අයත් නොවන මූලික ලෝහ භාණ්ඩ නිෂ්පාදනය 1996 වසරෙහිදී සියයට 15.2 කින් ඉහළ ගියේය. ඉකුත් වසර තුළ ද මෙම කාණ්ඩයෙහි මීට සමාන වර්ධනයක් දක්නට ලැබිණි. ඉදි කිරීමේ කටයුතුවල සිදුවූ වර්ධනය, යකඩ, වානේ සහ ඇළුමිණියම් නිෂ්පාදනය ඉහළ යෑමට හිතකර ලෙස බලපෑවේය.

## රාජ්‍ය අංශයේ කර්මාන්ත

1995 වර්ෂයේ වාර්තාවූ සියයට 6.9 ක පහත වැටීම හා සසඳන කල, රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිෂ්පාදනය, 1996 වර්ෂයේදී මූර්ත වශයෙන් සියයට 10.8 ක වර්ධනයක් වාර්තා කළේය. මෙයට බොහෝදුරට බලපෑවේ රාජ්‍ය අංශයෙහි මුළු කාර්මික නිමැවුමට සියයට 87 කින් දායක වන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි නිෂ්පාදිතය (සියයට 12) සැලකිය යුතු ලෙස වැඩි වීමයි. ඛනිජ තෙල් නිෂ්පාදනය අත්හල විටද රාජ්‍ය අංශයෙහි නිෂ්පාදිතය සියයට 3 කින් ඉහළ ගියේය. රාජ්‍ය දැව සංස්ථාවෙහි සහ සීමාසහිත ලංකා වානේ සංස්ථාවෙහි ඉහල ක්‍රියාකාරීත්වය මෙයට බොහෝ දුරට හේතු විය.

සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම (සියයට 26), සීමාසහිත ලංකා වානේ සංස්ථාව (සියයට 23), රාජ්‍ය දැව සංස්ථාව (සියයට 21), ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (සියයට 12), සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (සියයට 11) සහ සීමාසහිත ලංකා ලුණු සමාගම (සියයට 3) යන ආයතන 1996 වර්ෂය තුළ නිෂ්පාදන වර්ධනයන් වාර්තා කර ඇත.

ප්‍රධාන වශයෙන් ජපානයෙන් හා වෙනත් දියුණු රට වලින් එච්. ටී. ඉල්මනයිට් සඳහා හිතකර විදේශ ඉල්ලුමක් පැවතීම නිසා සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගමේ නිෂ්පාදනය ඉහළ ගියේය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දැව සංස්ථාවට දැව කඳන් විශාල ප්‍රමාණයක් සපයනු ලැබීය. 1996 වසර තුළ ඛනිජ තෙල් පිරිපහදු කටයුතු සාමාන්‍ය පරිදි සිදුවීමත්, තාපබල විදුලිය උත්පාදනය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ටවූ ඉල්ලුම වැඩි වීමත් නිසා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි නිෂ්පාදනය ඉහළ ගියේය.

යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියා කටයුතු සහ නියඟය හේතුවෙන් උක් දඬු සැපයීමේ ප්‍රමාදය නිසා සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනයෙහි නිෂ්පාදනය සියයට 14 කින් අඩු විය. කඩදාසි නිෂ්පාදනය සඳහා ආනයන

**සංඛ්‍යා සටහන 4.4**
**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය**

**1977 = 100**

| කාණ්ඩය | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 13.4 | 8.1 | 9.3 | 10.2 | 9.2 |
| 2. රෙදිපිළි, ඇඳුම් සහ සම් නිෂ්පාදිත | 27.5 | 10.3 | - | - | - |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 20.3 | 25.4 | 22.0 | 26.3 | 31.7 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 156.6 | 174.1 | 187.8 | 173.2 | 152.2 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 86.9 | 121.8 | 126.3 | 118.0 | 132.0 |
| ඛණිජතෙල් නිෂ්පාදිත | 91.8 | 129.4 | 134.2 | 124.2 | 138.9 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 143.4 | 120.0 | 5.5 | 5.9 | 6.8 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 125.7 | 92.4 | 130.8 | 95.0 | 116.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - |
| සියළුම කාණ්ඩ | 73.3 | 87.9 | 83.8 | 78.0 | 86.2 |
| ඛනිජතෙල් නිෂ්පාදිත හැර | 52.7 | 41.7 | 27.7 | 24.5 | 25.1 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

බදු අඩු කිරීම හේතුවෙන් දේශීය වෙළෙඳපොල තරගකාරිත්වය වැඩිවීම ජාතික කඩදාසි සංස්ථාවෙහි නිෂ්පාදනය සියයට 12 කින් පහත වැටීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය. සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවද සියයට 3 ක නිෂ්පාදනය පහත වැටීමක් වාර්තා කළේය.

## එකතුවූ අගය සහ ධාරිතා උපයෝජනය

ඉකුත් වර්ෂයේ වූ සියයට 17 ක වර්ධනය හා සසඳා බලන කල 1996 වර්ෂයේ කර්මාන්තවල එකතුවූ අගයෙහි නාමික වටිනාකම, අමුද්‍රව්‍ය වියදම් ඉහළ යෑම නිසා සියයට 16.6 කින් වැඩි විය. එකතු වූ අගයෙහි මූර්ත වටිනාකම සියයට 7.3 කින් වැඩි විය.

කාණ්ඩවල එකතුවූ වටිනාකම් අනුපාතය සියයට 50 ඉක්මවා ඇත. රසායන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 19.1), මූලික ලෝහ නිෂ්පාදන (සියයට 20.0) රෙදිපිළි සහ ඇඟළුම් (සියයට 30.6) ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 48.2) යන නිෂ්පාදන කාණ්ඩවල අඩු එකතුවූ වටිනාකම් අනුපාත වාර්තා විය.

ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්ත අංශයෙහි නිෂ්පාදන ධාරිතාව සියයට 2 කින් වැඩිවී ඇත. කෙසේ වුවද විදුලිය කපා හැරීම් මුල්කොට ගෙන ධාරිතා උපයෝජන අනුපාතය 1995 වසරෙහි දී වූ සියයට 84 හි සිට, 1996 දී සියයට 83 දක්වා සුළු වශයෙන් පහත වැටුනි. මෙම පහත වැටීම ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ රෙදිපිළි, ඇඟළුම් සහ සම්

**සංඛ්‍යා සටහන 4.5**

**කර්මාන්ත අංශයේ එකතු වූ අගය**

**(වර්තමාන මිළගණන් යටතේ)**

| කාණ්ඩය | රුපියල් දශලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) | 1995 | 1996 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 18,668 | 21,704 | 24,373 | 29,507 | 32,891 | 21.1 | 11.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 14,630 | 18,994 | 20,660 | 24,859 | 31,184 | 20.3 | 25.4 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 677 | 831 | 1,081 | 1,177 | 1,250 | 8.9 | 6.2 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 1,397 | 1,912 | 2,301 | 2,458 | 2,580 | 6.8 | 5.0 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 3,989 | 4,723 | 5,758 | 6,898 | 8,957 | 19.8 | 29.8 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 5,918 | 7,163 | 9,272 | 9,726 | 10,537 | 4.9 | 8.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 263 | 279 | 356 | 347 | 450 | -2.5 | 29.7 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 3,629 | 3,608 | 4,344 | 4,547 | 4,809 | 4.7 | 5.8 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 1,196 | 1,532 | 1,838 | 2,319 | 2,763 | 26.2 | 19.1 |
| එකතුව | 50,367 | 60,746 | 69,983 | 81,838 | 95,421 | 16.9 | 16.6 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

එකතුවූ අගය, නිෂ්පාදන වටිනාකමෙහි අනුපාතයක් ලෙස ගත් කල සියයට 37.0 ක් වූ අතර එය 1995 වර්ෂයේදී පැවැති අගය හා සමාන විය. දැව හා දැව නිෂ්පාදිත (සියයට 57.6) ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 55.5) සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 51.2) යන නිෂ්පාදන නිෂ්පාදන, ආහාර, පාන වර්ග සහ දුම්කොළ සහ රසායනික රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයන් වලය.

**සංඛ්‍යා සටහන 4.6**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමවුම් ලාභය (අ)**

| කාණ්ඩය | මුළු නිෂ්පාදන පිරිවැය (රු. දශ) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු. දශ) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 43,428 | 54,911 | 50,439 | 62,257 | 13.9 | 11.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 12,893 | 14,504 | 17,009 | 18,812 | 24.2 | 22.9 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 1,082 | 1,163 | 1,270 | 1,391 | 14.8 | 16.4 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,521 | 2,713 | 3,071 | 3,262 | 17.9 | 16.8 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 6,657 | 7,362 | 7,643 | 8,216 | 12.9 | 10.4 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 8,699 | 9,356 | 10,430 | 11,494 | 16.6 | 18.6 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 803 | 1,039 | 893 | 1,161 | 10.1 | 10.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5,946 | 6,477 | 7,226 | 7,674 | 17.7 | 15.6 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 2,565 | 2,435 | 3,004 | 2,941 | 14.6 | 17.2 |
| එකතුව | 84,595 | 99,960 | 100,985 | 117,208 | 16.2 | 14.7 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නොවන ආයතන 460 කින් ලැබී ඇති තොරතුරු මත පදනම්වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4.7**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තවල පිරිවැය ව්‍යුහය (අ)**
**(මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| කාණ්ඩය | දේශීය පිරිවැය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉන්ධන හා බලය | | වැටුප් | | අමුද්‍රව්‍ය | | පොලී පිරිවැය | |
| | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 | 1995 | 1996 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 2.1 | 1.9 | 11.4 | 11.8 | 45.6 | 48.0 | 1.3 | 1.9 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 5.3 | 4.7 | 16.5 | 15.4 | 10.3 | 11.2 | 2.6 | 2.6 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 3.1 | 3.3 | 17.8 | 19.3 | 54.7 | 58.3 | 3.1 | 4.9 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2.6 | 2.8 | 9.3 | 9.4 | 18.1 | 16.0 | 4.0 | 4.7 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 5.9 | 5.0 | 10.7 | 10.5 | 27.3 | 24.0 | 2.8 | 3.3 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 11.8 | 12.7 | 11.3 | 12.4 | 7.3 | 8.5 | 3.2 | 2.7 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 10.6 | 7.3 | 8.5 | 5.8 | 10.1 | 4.4 | 0.4 | 6.4 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 3.0 | 3.1 | 10.8 | 11.4 | 17.1 | 17.5 | 4.7 | |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5.6 | 5.1 | 18.1 | 20.9 | 62.6 | 60.0 | 1.4 | 5.5 |
| එකතුව | 4.1 | 3.8 | 12.3 | 12.4 | 32.3 | 34.3 | 2.1 | 2.6 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 460 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 4.4 නිෂ්පාදන පිරිවැය සහ ලාභදායිත්වය

මහ බැංකු සමීක්ෂණයට අනුව ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්ත අංශයෙහි සාමාන්‍ය කම්හල් ලාභ අනුපාතය (ලාභය මුළු නිෂ්පාදන වටිනාකමෙහි අනුපාතයක් ලෙස) 1995 වසරෙහි වූ සියයට 16.2 හි සිට 1996 වසරෙහිදී සියයට 14.7 දක්වා පහත වැටුණි. මෙය නිෂ්පාදන පිරිවැය සියයට 18.2 කින් හා කම්හලෙන් පිටවන විට නිෂ්පාදන වටිනාකම සියයට 16.8 කින් ඉහළ යැමෙහි ප්‍රතිඵලයකි. 1996 වසර තුළ වැටුප්, පොලී සහ අනෙකුත් වියදම් ඉහළ ගියේය. කර්මාන්ත අතර ලාභදායිත්වය සියයට 10 සිට සියයට 23 දක්වා පරාසයක් තුල වෙනස් විය. 1995 වර්ෂයේ සියයට 24.2 ක් වූ රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයෙහි ලාභ අනුපාතය 1996 වර්ෂයේදී සියයට 22.9 දක්වා සුළු වශයෙන් අඩු වුවද, එය 1996 වර්ෂයේදී වාර්තාවූ ඉහළම ලාභදායිතා අනුපාතය විය. ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්ත අංශයෙහි අමුද්‍රව්‍ය පිරිවැයෙහි නාමික වටිනාකම සියයට 25.2 කින් ඉහළ ගියේය. ඉහළම වැඩිවීම වූ සියයට 32.8 වාර්තා වූයේ ආහාර, පාන වර්ග හා දුම්කොළ කාණ්ඩයෙනි. දේශීය අමුද්‍රව්‍ය මිළ ඉහළ යැම මෙයට ප්‍රධාන හේතුව විය. රෙදිපිළි ඇඟළුම් හා සම් භාණ්ඩ කාණ්ඩයෙහි දේශීය අමුද්‍රව්‍ය භාවිතය නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කල 1995 දී වූ සියයට 10.3 හි සිට 1996 දී සියයට 11.2 දක්වා සුළු වශයෙන් වැඩි විය. ආහාර, පාන වර්ග දුම්කොල කාණ්ඩයෙහි මෙම අනුපාතය 1995 දී වූ සියයට 45.6 හි සිට 1996 දී සියයට 48.0 දක්වා වැඩි විය.

ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්ත භාවිතා කරන ලද බලය සහ ඉන්ධන පිරිවැය නාමික වශයෙන් 1996 වර්ශයේදී සියයට 8.4 කින් ඉහළ ගියේය. මුළු නිෂ්පාදන පිරිවැයෙන් බල හා ඉන්ධන වියදම් 1995 දී වූ සියයට 4.1 හි සිට 1996 දී සියයට 3.8 දක්වා අඩු විය. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රධානතම පිරිවැය බලය සහ ඉන්ධන වූ අතර ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයෙහි මෙය අඩුම පිරිවැය විය.

ආයෝජන මණ්ඩලය යටතේ නොවන පුද්ගලික අංශයෙහි කර්මාන්තවල වේතන පිරිවැය නාමික වශයෙන් 1996 වසරෙහිදී සියයට 19.9 කින් වැඩි විය. වේතන සහ වැටුප් මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කල 1995 දී වූ සියටට 12.3 හි සිට 1996 දී සියයට 12.4 දක්වා සුළු වශයෙන් වැඩි විය. කර්මාන්තවල ශ්‍රම දායකත්වය (වැටුප් පිරිවැය මුළු පිරිවැයෙහි කොටසක් ලෙස ගත් කල), දැව හා දැව නිෂ්පාදන කාණ්ඩයෙහි සියයට 19.3 ක්ද, රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදන කාණ්ඩයෙහි සියයට

**සංඛ්‍යා සටහන 4. 8**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල සේවානියුක්තිය**

සංඛ්‍යා

| අංශ | 1995 | 1996 | ප්‍රතිශත වෙනස 1996 |
|---|---|---|---|
| **(I) ශ්‍රී. ලං. ආ. ම. යටතේ නොවන පෞද්ගලික අංශයේ නිෂ්පාදන ආයතන (අ)** | | | |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 18,478 | 18,384 | -0.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 59,131 | 58,295 | -1.4 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 1,322 | 1,312 | -0.8 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 6,250 | 6,392 | 2.3 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 14,132 | 13,601 | -3.8 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 9,528 | 9,096 | -4.5 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 950 | 902 | -5.1 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 6,089 | 5,859 | -3.8 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4,418 | 4,378 | -0.9 |
| අනු එකතුව | 120,298 | 118,219 | -1.7 |
| **(II) ශ්‍රී. ලං. ආ. ම. ව්‍යවසායයන්** | 233,374 | 241,970 | 3.7 |
| එකතුව | 353,672 | 360,189 | 1.8 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 460 කින් ලැබී ඇති තොරතුරු මත පදනම්ව ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව,
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

15.4 ක්ද වේ. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන, මූලික ලෝහ නිෂ්පාදන සහ සකස් කළ ලෝහ නිෂපාදන හා යන්ත්‍ර හා උපකරණ කාණ්ඩයෙහි අවම ශ්‍රම දායකත්වයක් දක්නට ලැබුණි.

ඉහළ ණය දීමේ අනුපාත සහ ණය ලබා ගැනීම් වැඩිවීම පිළිබිඹු කරමින් ආයෝජන මණ්ඩලය යටතේ නොවන පුද්ගලික අංශයේ කර්මාන්තවල පොලී වියදම් 1996 වසරෙහිදී සියයට 41.5කින් වැඩි විය. පොලී වියදම් මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස බලන කලද 1995 දී වූ සියයට 2.1 සිට 1996 දී සියයට 2.6 දක්වා වැඩි වී ඇත. ඉහළ පොලී පිරිවැය අනුපාතිකයක් වාර්ථා වූයේ සකස් කල ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සහ උපකරණ, මූලික ලෝහ නිෂ්පාදිත සහ දැව හා දැව නිෂ්පාදිත යන කාර්මික කාණ්ඩවලය.

## කාර්මික සේවා නියුක්තිය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තවල සේවා නියුක්තියේ වර්ධනයක් පිළිබිඹු කරමින් කාර්මික අංශයේ සේවා නියුක්තිය 1996 දී සියයට 2 කින් පමන වර්ධනය විය. 1996 දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත අතිරේක සේවා නියුක්ති අවස්ථාවන් 8,569 ක් උත්පාදනය කළේය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත 460 ක් ආවරණය වන පරිදි කරන ලද 1996 කාර්මික නිෂ්පාදන පිළිබඳ වාර්ෂික සමීක්ෂණයට අනුව 1995 දී 120,298 ක් වූ සේවා නියුක්තිය 1996 දී 118,219 දක්වා සියයට 1.7 කින් පහත වැටුණි. වර්ෂය තුළදී කඩදාසි හා කඩදාසි නිෂ්පාදන කාණ්ඩය හැරුණු විට අනෙකුත් සියළුම ප්‍රධාන කාර්මික කාණ්ඩයන්හි සේවා නියුක්තිය පහත වැටුණි. කඩදාසි හා කඩදාසි නිෂ්පාදන කාණ්ඩයෙහි සියයට 2.3 ක සේවා නියුක්ති වර්ධනයක් පෙන්නුම් කළේය. අනිකුත් කාර්මික කාණ්ඩවලට වඩා මූලික ලෝහ නිෂ්පාදිත, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සහ රසායනික, ඛනිජ තෙල් හා රබර් නිෂ්පාදිත යන කාර්මික කාණ්ඩයන්හි සේවා නියුක්තියෙහි පහත වැටීමක් වාර්තා විය.

## 4.5 ආයෝජන

### විදේශ ආයෝජන

දේශීය ඉතිරිකිරීම් ප්‍රමාණවත් නොවන නිසා ශ්‍රී ලංකාව විදේශීය ප්‍රාග්ධන ගලා ඒම කෙරෙහි දැඩි බලාපොරොත්තුවක් තබා ඇත. මෙම ප්‍රාග්ධන ගලාඒම් නිසා නව තාක්ෂණික ඥානය ලබාගැනීමට සහ දියුණු වෙළඳපොලවල් කරා ප්‍රවිෂ්ඨ වීමට හැකියාව ලැබී ඇති අතර එය නිෂ්පාදන අංශයෙහි වර්ධනයට ද ඉවහල් වී ඇත. ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජනය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ ප්‍රධාන ආයතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වර්ෂය තුළදී සැළකිය යුතු ව්‍යාපෘති සංඛ්‍යාවක් අනුමත කර ඇත. 1996 වර්ෂයේදී අනෙකුත් දියුණුවෙමින් පවත්නා රටවල් වලින් තරගකාරීත්වයක් තිබියදීත් ප්‍රධාන වශයෙන් ජපානය, දකුණු කොරියාව, හොංකොං, සිංගප්පූරුව, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, ඉතාලිය, ඉන්දියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රට වලින් සැළකිය යුතු විදේශ ප්‍රාග්ධන ප්‍රමාණයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තයන්හි දැනට කර ඇති ආයෝජනය 1995 දී සියයට 46 ක අඩුවීමක් වාර්තා කල අතර එය 1996 වර්ෂයේදී සියයට 56 කින් වර්ධනය විය.

ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 32,100 ක ආයෝජන ප්‍රමාණයක් සහිතව අනුමත කළ ව්‍යාපෘති 220 හා සසඳා බලන කල 1996 දී රුපියල් දශලක්ෂ 452,600 ක ආයෝජන වටිනාකමක් ඇති ව්‍යාපෘති 254 ක් අනුමත කරන ලදී. මේ අනුව 1996 වසර අවසානය වනවිට අනුමත කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 1,953 දක්වා ඉහළ නැංවුනි. මෙයට රුපියල් දශලක්ෂ 394,000 ක ආයෝජන ප්‍රමාණයක් සහිත ඛනිජ තෙල් සැකසුම් යන්ත්‍රාගාර තුනක් වෙනුවෙන් අනුමත කළ ආයෝජන මුදලද ඇතුලත් විය. වර්ෂය තුළදී අනුමත කරන ලද මුළු ආයෝජන වලින් සියයට 95 ක් හෙවත් රුපියල් දශලක්ෂ 428,000 ක් විදේශ ආයෝජන වලින් සමන්විත විය. මෙම ඉහළ මට්ටමේ විදේශ ආයෝජන සංයුතිය තෙල් පිරිපහදු ව්‍යාපෘති තුන හා බැඳුණු විදේශ ආයෝජන වලින්

සංඛ්‍යා සටහන 4.9

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් දැනට කර ඇති ආයෝජන (අ)

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | විදේශ ආයෝජන (රු. දල.) | | මුළු ආයෝජන (රු. දල.) | |
|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 (ඇ) | 1995 | 1996 (ඇ) | 1995 | 1996 (ඇ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 53 | 77 | 1,290 | 2,274 | 1,974 | 4,437 |
| 2. රෙදිපිළි, ඇගළුම් සහ සම් නිෂ්පාදිත | 109 | 117 | 11,064 | 12,351 | 12,821 | 15,045 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 17 | 19 | 488 | 474 | 551 | 564 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 9 | 12 | 167 | 326 | 362 | 550 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 52 | 66 | 4,945 | 5,762 | 5,633 | 6,877 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 39 | 42 | 774 | 972 | 2,345 | 2,783 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 19 | 20 | 615 | 605 | 978 | 1,180 |
| 8. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 91 | 102 | 2,919 | 3,499 | 4,068 | 4,647 |
| 9. සේවා | 217 | 255 | 28,108 | 34,694 | 43,487 | 55,539 |
| එකතුව | 606 | 710 | 50,370 | 60,957 | 72,219 | 91,622 |


(අ) වර්ෂය අවසානයේ එකතුවූ අගය
(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 17 වන වගන්තිය යටතේ අනුමත කරනලද ව්‍යාපෘති
(ඇ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

රූප සටහන 4.4

වි.ගැ.හි. දු.ල.     ගිවිසගත් සහ දැනට කරඇති ආයෝජන

1992 - 1996




පිළිබිඹු විය. 1996 අවසානය වන විට අනුමත කළ මුළු ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 1,277 ක් සම්බන්ධව ගිවිසුම් අත්සන් කර තිබුණි. මේවායින් ඇඟළුම් කම්හල් 200 වැඩසටහනට අයත් ව්‍යාපෘති 154 ක් ද ඇතුලත් කර්මාන්තශාලා 864 ක් රුපියල් දශලක්ෂ 97,000 ක් 1996 අවසන් වනවිට ආයෝජනය කර තිබුණි. මෙම ආයෝජනයන්හි විදේශ ආයෝජන කොටස මුළු ආයෝජන වලින් සියයට 65 ක් හෙවත් රුපියල් දශලක්ෂ 63,000 ක් විය. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත, රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, ආහාර, පාන වරග, දුම්කොල සහ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත යන ප්‍රධාන කාර්මික කාණ්ඩයන්හි මෙම ආයෝජනය සිදු කර ඇත.

දේශීය ආදායම් හා බදු සම්බන්ධ නීති යටතේ (සාමාන්‍ය නීතිය) ආයෝජන මණ්ඩලය 1995 දී අනුමත කළ ව්‍යාපෘති 62 හා සසඳා බලන කල 1996 දී ව්‍යාපෘති 85 ක් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘතිවල අපේක්ෂිත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 4,600 ක් වූ අතර එහි විදේශ ආයෝජන දායකත්වය සියයට 74 ක් හෙවත් රුපියල් දශලක්ෂ 3,400 ක් විය.

ඇඟළුම් කම්හල් 200 වැඩසටහන ද ඇතුළුව ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි මුළු සේවා නියුක්තිය 1995 දී සියයට 13 කින් වර්ධනය වූ අතර 1996 වර්ෂයේදී එය 241,970 දක්වා සියයට 4 කින් වැඩිවිය.

## දේශීය ආයෝජන

ආයෝජන මණ්ඩලය අනුමත කළ ව්‍යාපෘතීන්හි සැළකිය යුතු දේශීය ආයෝජන ප්‍රමාණයක් විය. ඉහළ විදේශ ප්‍රාග්ධනයකින් සමන්විත තෙල් පිරිපහදු ව්‍යාපෘති තුන හේතුවෙන් 1995 දී සියයට 57 ක් වූ දේශීය ආයෝජනය 1996 දී සියයට 5 දක්වා තීව්‍ර ලෙස පහත වැටුණි. මේ හේතුවෙන් 1996 දී රුපියල් දශලක්ෂ 452,600 ක් වූ ආයෝජන වලින් රුපියල් දශලක්ෂ 23,800 ක් පමණක් දේශීය මූලයන්ගෙන් සපයා ගැනීමට අපේක්ෂා කෙරුනි. 1996 වසර අවසානය වන විට ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 864 හි දේශීය ආයෝජනය, සමස්ත ආයෝජනයෙන් රුපියල් දශලක්ෂ 34,200 ක් හෙවත් සියයට 35 ක් විය. ප්‍රධාන වශයෙන් සැහැල්ලු සෙල්ලම්බඩු, ස්වර්ණාභරණ, ගොතන ලද රෙදි, නූල් සහ අමු රෙදි, ලී වලින් කරන ලද අත්කම් භාණ්ඩ, පළතුරු හා එළවළු සැකසුම්, මුළුතැන් ගෙයි උපකරණ, විදුලි සංදේශ උපකරුණ සහ ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය උපාංග යන නිෂ්පාදනයන්හි මෙම ආයෝජනයන් කර ඇත. තවද සාමාන්‍ය දිරි ගැන්වීම් යෝජනා ක්‍රමය යටතේ ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි දේශීය ආයෝජන සංයුතිය රුපියල් දශලක්ෂ 1200 ක් හෙවත් සමස්ත ආයෝජනයෙන් සියයට 26 ක් විය.

මේ අතර 1996 වසර අවසානය වන විට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන් 1,637 හි සමස්ත ආයෝජනය රුපියල් දශලක්ෂ 618,600 ක් විය. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත, රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ දුම්කොළ යන කාණ්ඩයන්හි මෙම ආයෝජනයන් කර ඇත. මෙම ව්‍යවසායයන් 1995 අවසාන වන විට

**සංඛ්‍යා සටහන 4.10**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අපනයන ඉපයුම් සහ සේවා නියුක්තිය (අ)**

| කාණ්ඩය | සේවා නියුක්තිය (දෙසැම්. අවසානයට) | | දළ අපනයන ඉපයුම් (රු.දල) (නැ.වි.ස.) | |
|---|---|---|---|---|
| | 1995 | 1996 | 1995 | 1996 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 8,166 | 6,931 | 3,963 | 4,857 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 153,664 | 156,391 | 73,287 | 82,050 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 2,500 | 2,449 | 293 | 342 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 519 | 733 | 574 | 857 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 19,047 | 20,509 | 12,217 | 15,083 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 9,160 | 9,226 | 6,155 | 7,068 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 1,252 | 1,399 | 722 | 1,132 |
| 8. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 23,734 | 26,645 | 9,151 | 12,822 |
| 9. සේවා | 15,332 | 17,687 | 7,001 | 9,272 |
| එකතුව | 233,374 | 241,970 | 113,363 | 133,483 |

(අ) තාවකාලික
(ආ) එයාර්ලංකා සමාගම හැර

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

පුද්ගලයින් 300,036 දෙනෙකුට රැකියා සපයා දී තිබූ අතර, 1996 වන විට එම ප්‍රමාණය 301,450 දක්වා සුළු වශයෙන් වැඩි වී ඇත.

## 4.6 කර්මාන්ත අංශයට ලබාදී ඇති ණය

1996 වසර තුළ ප්‍රධාන සංවර්ධන බැංකු දෙක සහ වාණිජ බැංකු විසින් ප්‍රතිමූල්‍ය අනුමත කිරීම, සෘජු ණය සහ ස්කන්ධ සහභාගිත්ව වශයෙන් කර්මාන්ත අංශයට මූල්‍යාධාර සැපයීම තවදුරටත් කරගෙන යනු ලැබිය. ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය, 1995 වසරේහිදී ව්‍යාපෘති 2,764 ක ආයෝජනය කරන ලද රුපියල් දශලක්ෂ 11,855 ප්‍රමාණය හා සසඳන කල 1996 වසර තුළ ව්‍යාපෘති 1,693 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 10,845 ක මුළු ණය ප්‍රමාණයක් අනුමත කර ඇත. මෙමගින් පෙන්නුම් කරනු ලබනුයේ, නියගය හා විදුලිය කපා හැරීමෙහි අපහසුතාවයන් මධ්‍යයේ වුවද කාර්මික අංශයෙහි ආයෝජන තවදුරටත් වැඩිවූ බවකි. 1995 වසරේ මුල් මාස නමය තුල සිදුවූ සියයට 25 ක වර්ධනය හා සසඳන කළ 1996 අනුරූප කාලය තුලදී වාණිජ බැංකු මගින් කර්මාන්ත අංශයට දුන් ණය ප්‍රමාණය සියයට 17 කින් වැඩිවිය.

ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයන ලද අරමුදල් යොදවමින් ජාතික සංවර්ධන බැංකුව IV වන සුළු හා මධ්‍යම පරිමාන ණය ක්‍රමය (සුමක IV) යටතේ ව්‍යාපෘති 1,141 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 794 ක මූල්‍ය පහසුකම් සලසා ඇත. ජාතික සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘති 240 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 7,401 ක සෘජු මූල්‍යාධාර සපයා ඇති අතර මෙය 1995 වසරෙහිදී ව්‍යාපෘති 431 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 6,519 ක් විය. තවද, ජාතික සංවර්ධන බැංකුව රුපියල් දශ ලක්ෂ 643 ක් සපයමින් ව්‍යාපෘති 12 කට සහභාගී වී ඇත. 1995 වසරේදී මෙම සහභාගිත්වය ව්‍යාපෘති 10 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 477 ක් විය. රසායන, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන යන අංශවලට මෙමගින් පහසුකම් සැලසුණි.

1995 වසර තුළ ව්‍යාපෘති 480 ක් සඳහා අනුමත කරන ලද රුපියල් දශ ලක්ෂ 3,424 ක ණය ප්‍රමාණය හා සසඳන කළ, ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය 1996 වසරේදී ව්‍යාපෘති 338 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 2,076 ක් ණය වශයෙන් ලබා දී ඇත. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර හා ප්‍රවාහණ උපකරණ, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන මෙම ණය පහසුකම් වලින් වැඩි කොටසකට හිමිකම් කී කාර්මික කාණ්ඩ විය.

## 4.7 කාර්මික ප්‍රතිපත්තිය

නව කර්මාන්ත හා ආයෝජනවලට අනුග්‍රහය දක්වනු වස් අවම රාජ්‍ය නියාමයන් හා පාලන යටතේ, අවශ්‍ය බදු හා කාර්මික දිරි ගැන්වීම් ලබා දිය හැකිවන පරිදි රජයේ කාර්මික සංවර්ධන උපාය මාර්ගය සැලසුම් කොට ඇත. රජයේ කාර්මීකරණ උපායමාර්ගයෙහි මූලික අරමුණ වනුයේ, විවිධාංගීකරණය දිරි ගැන්වීම, කාර්මික පදනම වැඩිදියුණු කිරීම සහ ප්‍රසාරණය කිරීම, භෞතික හා මිනිස්බල සම්පත් කළමණාකරණයෙහි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, නව රැකියා අවස්ථා බිහි කිරීම, සේවකයින්ගේ ආදායම් මට්ටම ඉහළ දැමීම, අපනයන නැඹුරුව දිරි ගැන්වීම හා ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ව්‍යාප්ත කිරීම උනන්දු කිරීම වේ.

උසස් තාක්ෂණයෙහි ආයෝජනය කිරීම සඳහා කර්මාන්ත අංශයට සපයන ලද බදු සහන හැරුණු කොට ආයතන තුල තාක්ෂණ කටයුතු වැඩි දියුණු කිරීම, අපනයන දිරි ගැන්වීම් හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා රජය විසින් 1996 වසර තුළ විශේෂ ව්‍යාපෘති කිහිපයක් සඳහා තවදුරටත් ණය ආධාර සපයා ඇත. සුමක අංශයෙහි හා පරිසරයට හිතකර තාක්ෂණයෙහි ප්‍රවර්ධනය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, තාක්ෂණය සහ කළමණාකරණ විධි හඳුනා ගැනීමේ සහ සපයාගතහැකි මූලාශ්‍ර යෝජනාකිරීමේ සහ ඒවා අත්පත් කර ගැනීමේදී ආයතනවලට සහය වීමට හැකිවන පරිදි එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙහි අනුග්‍රහය යටතේ වන පෞද්ගලික අංශයට තාක්ෂණය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය 1995 වසරෙහි සිට පස් අවුරුදු කාලයකට දීර්ඝ කොට ඇත. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙලෙහි සහාය ඇතිව පිහිටුවන ලද කාර්මික තාක්ෂණ වෙළෙඳපොල තොරතුරු ජාලය මගින් තාක්ෂණය හා වෙළෙඳපොල පිළිබඳ කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා තව දුරටත් ආධාර සපයනු ලැබිය. ජර්මන් රජය මගින් සපයන ලද අරමුදල් යටතේ වන කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය කෘෂි සැකසුම් හා ඒ ආශ්‍රිත

**සංඛ්‍යා සටහන 4.11**

**ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය සහ ජාතික සංවර්ධන බැංකුව විසින් කර්මාන්ත අංශයට සපයා ඇති මූල්‍ය පහසුකම් - 1996 (අ)**

| කාණ්ඩය | ජාතික සංවර්ධන බැංකුව | | | | | | | | ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත කළ ප්‍රතිමූල්‍ය පහසුකම් සු.ම.ක IV | | සෘජු මූල්‍ය පහසුකම් | | ප්‍රාග්ධන සහභාගිත්වය | | එකතුව | | අනුමත නොකළ ණය | | ප්‍රාග්ධන සහභාගිත්වය | | එකතුව | | මුළු එකතුව | |
| | ප්‍රමාණය | රු. ද. ල | ප්‍රමාණය | රු. ද. ල | ප්‍රමාණය | රු. ද. ල | ප්‍රමාණය | රු. ද. ල | ප්‍රමාණය | රු. ද. ල | ප්‍රමාණය | රු. ද. ල | ප්‍රමාණය | රු. ද. ල | ප්‍රමාණය | රු. ද. ල |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 197 | 125 | 24 | 1,126 | 1 | 100 | 222 | 1,350 | 106 | 542 | - | - | 106 | 542 | 328 | 1,892 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 46 | 38 | 25 | 283 | 3 | 59 | 74 | 381 | 44 | 194 | - | - | 44 | 194 | 118 | 575 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 63 | 26 | 11 | 23 | 4 | 104 | 78 | 153 | 27 | 73 | - | - | 27 | 73 | 105 | 226 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 21 | 27 | 2 | 10 | - | - | 23 | 37 | 21 | 123 | - | - | 21 | 123 | 44 | 160 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 37 | 49 | 38 | 1,388 | 1 | 20 | 38 | 1,388 | 47 | 250 | - | 8 | 47 | 258 | 85 | 1641 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 63 | 39 | - | - | - | - | 63 | 39 | 20 | 216 | - | - | 20 | 216 | 83 | 255 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 69 | 36 | 9 | 210 | - | - | 78 | 247 | 4 | 7 | - | - | 4 | 7 | 82 | 254 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - | - | - | - | 68 | 643 | 1 | 20 | 69 | 663 | 69 | 663 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 645 | 453 | 131 | 4,361 | 3 | 359 | 779 | 5,173 | - | - | - | - | - | - | 779 | 5,173 |
| එකතුව | 1141 | 973 | 240 | 7401 | 12 | 642 | 1,355 | 8,768 | 337 | 2,048 | 1 | 28 | 338 | 2,076 | 1,693 | 10,844 |

(අ) තාවකාලික

මූලය : ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය
ජාතික සංවර්ධන බැංකුව

තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා සහයෝගය දැක්වීමට බලාපොරොත්තු වේ. ජර්මන් රජයේ ආධාර යටතේ 1995 දී පිහිටුවන ලද පෞද්ගලික අංශ වැඩපිළිවෙල ද 1996 දී තවදුරටත් ක්‍රියාත්මක විය. තත්වය උසස් කිරීම, කළමණාකරන හා වෙළෙඳපොල හැකියාවන් පිළිබඳ උපදේශක සේවාවන් සැපයීමෙන් පෞද්ගලික අංශයේ ආයතනවල අපනයන ස්ථාවරත්වය වැඩිදියුණු කිරීමට මෙම වැඩපිළිවෙල මගින් සහාය ලැබේ.. රබර්, පාවහන්, දැව, සෙල්ලම් බඩු, අත්‍යාවශ්‍ය තෙල් වර්ග සහ ආහාර ද්‍රව්‍ය වැනි තෝරාගත් අංශවල පෞද්ගලික අංශයේ ව්‍යවසායයන්හි ජාත්‍යන්තර තරගකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා ජර්මනිය සහ විදේශ ආයෝජකයින් සමග හවුල් ව්‍යාපාර පිහිටුවා ගැනීම සඳහා ද මෙම ව්‍යාපෘතිය මගින් ආධාර සපයනු ලැබේ.

1996 වසරෙහිදී පිහිටුවන ලද විද්‍යාව හා තාක්ෂණය සඳහා වන ජනාධිපති කාර්ය බලකාය මගින් වෙළෙඳපොල මුල් කොටගත් කාර්මික පර්යේෂණ ආයතන වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව නිර්දේශ කීපයක් ඉදිරිපත් කරනු ලැබිය. වෙළෙඳපොල ඉල්ලුමට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා විද්‍යා හා තාක්ෂණ ආයතන, කාර්මික විද්‍යාගාර හා පර්යේෂණ ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රතිසංවිධානය කිරීම සඳහා එමගින් දැඩි අවධානය යොමුකොට ඇත.

වෙළෙඳපොලට හිතවාදී කාර්මික අංශයක් වර්ධනය කිරීම හා දැඩි බදු ආරක්ෂාව යටතේ වැඩිදියුණු වූ නිෂ්පාදන ආයතන, කාර්මික වර්ධනයෙහි ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීම සඳහා රජය දැනට පවතින ත්‍රිවිධාකාර බදු ක්‍රමයෙන් බැහැරව සියයට 15 කට සමාන ඒකීය බදු අනුපාතිකයක් කරා හැකි ඉක්මනින් යොමු වීමට බලාපොරොත්තු වේ. 1997 වසරෙහි අවසන් භාගයේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන යෝජිත භාණ්ඩ හා සේවා බදු ක්‍රමය තුළින් බදු මත බදු පැනවීමේ ප්‍රතිවිපාකය ඉවත් කිරීම කර්මාන්ත අංශයෙහි යහපත පිණිස වනු ඇත.

විදුලිය කැපීම නිසා කාර්මික නිෂ්පාදනයට සිදුවූ පාඩුව අඩු කරලීම පිණිස රජය විසින් 1996 ප්‍රථම භාගය තුළදී පියවර කිහිපයක් ගන්නා ලදී. ආයතන විසින් තමන්ගේම විදුලි උත්පාදක යන්ත්‍ර භාවිතා කිරීම සඳහා උනන්දු කරවනු ලැබූ අතර විදුලිය කැපීමෙන් දුෂ්කරතාවයට පත් කර්මාන්ත සඳහා විවිධ සහනදායී පියවර රැසක් ලබා දෙන ලදී. තීරුබදු රහිතව විදුලි උත්පාදක යන්ත්‍ර ආනයනය කිරීමට අවකාශ ලබාදීම, විශාල පරිමාණයේ විදුලි උත්පාදක යන්ත්‍ර වෙනුවෙන් සියයට 40 ක සහනාධාරයක් ලබාදීම, පෞද්ගලික අංශය විසින් උත්පාදනය කළ අතිරික්ත විදුලිබලය සහතික වූ වැඩි මිලකට මිලදී ගැනීම, කිලෝ වොට්ස් 100 වඩා වැඩි විදුලි උත්පාදක යන්ත්‍ර මිලදී ගැනීම පිණිස ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය සහ ජාතික සංවර්ධන බැංකුව මාර්ගයෙන් සහනදායී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ විදුලි බිල්පත් සඳහා සහනදායී ගෙවීම් ක්‍රමයක් සලසා දීම යනාදිය ලබාදුන් සහනදායී පියවර විය. මෙයට අමතරව එකිනෙක සලකා බැලීමේ පදනම මත ණය ප්‍රතිලේඛණ ගත කිරීම සහ හිඟ ණය මත ගෙවිය යුතු පොළිය ආංශික වශයෙන් ලියාහැරීම යන ක්‍රම මගින් වානිජ බැංකු දුෂ්කරතාවයට පත්වූ කර්මාන්ත වලට උදව් දුනි.

## කර්මාන්ත අංශයට ලබාදුන් දිරිදීම්

උසස් තාක්ෂණය උපයෝජනය කර ගැනීම සහ කාර්යක්ෂම කළමණාකරණය, නූතන කාර්මික අංශයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකනු ලබයි. දැනට පවත්නා සහ නව කර්මාන්තයන්හි නවීන තාක්ෂණය වෙනුවෙන් කරන ආයෝජන දිරිගැන්වීම සඳහා රජය විසින් 1996 අයවැය යෝජනා මගින් වැදගත් පියවර කිහිපයක් යෝජනා කරනු ලැබුණි. 1997 අයවැය යෝජනා මගින් කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත ඒකක විශාල ප්‍රමාණයක් ආවරණය වනු පිණිස, දිරි ගැන්වීම් යෝජනාවලිය යටතේ සුදුසුකම් ලැබීම් සඳහා කළයුතු ආයෝජනයේ අවම මට්ටම අඩු කිරීමට යෝජනා කරන ලදී. දැනට ක්‍රියාත්මකව පවතින දිරි ගැන්වීම් යෝජනාවලිය යටතේ නව කර්මාන්ත සහ දැනට පවත්නා කර්මාන්තයන් සඳහා අනුමත යන්ත්‍ර සහ උපකරණ ආනයනය වෙනුවෙන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 10 කට සහ රුපියල් දශ ලක්ෂ 25 කට වැඩියෙන් කරන ආයෝජන තීරුබදු වලින් නිදහස් වේ. මෙම දිරි ගැන්වීම් යෝජනාවලිය වෙනුවට 1997 බදු යෝජනා මගින් නව කර්මාන්ත සහ දැනට පවත්නා කර්මාන්ත යන්ත්‍ර සහ උපකරණ ආනයනය සඳහා කළයුතු අවම ආයෝජනය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 4 සහ රුපියල් දශ ලක්ෂ 1 දක්වා සංශෝධනය කරන ලදී. දැනට පවත්නා කර්මාන්තශාලා සලකා බලන කල උසස් තාක්ෂණය හඳුන්වා දීම නිර්දේශ කළ දින සිට වර්ෂයක් ඇතුලත රුපියල් දශ ලක්ෂ 4 කට වඩා

**සංඛ්‍යා සටහන 4.12**

**උසස් තාක්ෂණය දිරිගැන්වීමේ යෝජනාක්‍රමය යටතේ අනුමතකල ව්‍යාපෘති 1996 (අ)**

| කාණ්ඩය | නව | | | පවත්නා | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ආයෝජන රු.ද.ල. | අපේක්ෂිත රැකියා අවස්ථා | සංඛ්‍යාව | ආයෝජන රු.ද.ල. | අපේක්ෂිත රැකියා අවස්ථා | සංඛ්‍යාව | ආයෝජන රු.ද.ල. | අපේක්ෂිත රැකියා අවස්ථා |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 10 | 2,074 | 760 | 22 | 3,900 | 1,239 | 32 | 5,974 | 1,999 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 14 | 690 | 1,007 | 21 | 334 | 1,227 | 35 | 1,024 | 2,234 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 1 | 61 | 90 | 4 | 216 | 292 | 5 | 277 | 382 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 5 | 174 | 181 | 15 | 945 | 737 | 20 | 1,119 | 918 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 18 | 918 | 1,345 | 61 | 4,002 | 3,333 | 79 | 4,920 | 4,678 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 2 | 245 | 248 | 9 | 1,409 | 614 | 11 | 1,654 | 862 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 3 | 479 | 502 | 6 | 425 | 482 | 9 | 904 | 984 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 6 | 411 | 382 | 33 | 1,724 | 1,423 | 39 | 2,135 | 1,805 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 11 | 1,533 | 412 | 15 | 440 | 1,751 | 26 | 1,973 | 2,163 |
| 10. සේවා | 6 | 467 | 369 | 12 | 2,871 | 953 | 18 | 3,338 | 1,322 |
| එකතුව | 76 | 7,052 | 5,296 | 198 | 16,266 | 12,051 | 274 | 23318 | 17,347 |

(අ) තාවකාලික

මූලය : කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

ආයෝජනය කරනු ලබන්නේ නම් සහ කර්මාන්ත ප්‍රසාරණය ආරම්භ කර මාස 6 ක් ඇතුලත අඩුම වශයෙන් සේවකයින් 50 කට රැකියා අවස්ථා ලබා දෙන්නේ නම් එම ආයතනයට යන්ත්‍රසූත්‍ර ආනයනය සඳහා තීරුබදු හා ව්‍යාපාර පිරිවැටුම් බදු නිදහස් කිරීම් ලැබෙන අතර, නව මෙහෙයුම් කටයුතු ආරම්භ කල දින සිට වර්ෂ 5 ක් ඇතුලත උපයන අතිරේක ලාභ බදු වලින් නිදහස් වනු ඇත. මෙම දිරිගැන්වීම් යෝජනා ක්‍රමය, කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත, පශු සම්පත්, ධීවර කටයුතු සංචාරක කටයුතු සහ මානව සම්පත් සංවර්ධනය වැනි කර්මාන්ත සහ සේවා සඳහා ලැබෙනු ඇත.

මෙම යෝජනා ක්‍රමය යටතේ, රුපියල් දශලක්ෂ 7,100 ක් වටිනා ආයෝජනයක් සහිත නව කර්මාන්ත 76 ක්, 1996 අවසාන වන විට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත. මෙම ව්‍යාපෘතීන් මගින් පුද්ගලයින් 5,296 කට රැකියා අවස්ථා ලබාදීමට අපේක්ෂිතය. මීට අමතරව 1996 අවසානය වන විට රුපියල් දශලක්ෂ 16,300 ක් වටිනා ආයෝජනයක් සහිත දැනට පවත්නා ව්‍යවසායයන් 198 ක්ද, මෙම යෝජනා ක්‍රමය යටතේ අනුමත කර ඇත. මෙම ව්‍යවසායකයන්ට පුද්ගලයින් 12,051 දෙනෙකුට නව රැකියා අවස්ථා ලබාදීමට හැකියාව ඇත.මෙම ව්‍යවසායයන් මගින් පුද්ගලයින් 42,000 කට පමණ වක්‍ර ලෙස රැකියා අවස්ථා ලබා දිය හැකි බව කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය ඇස්තමේන්තු කර ඇත. මෙම අනුමත කළ ආයෝජන වලින් රෙදිපිළි සහ ඇඟළුම් වැනි සම්ප්‍රදායික කර්මාන්තවලට වඩා ආහාර සහ පාන වර්ග, රසායනික, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ සකස්කළ ලෝහ නිෂ්පාදන වැනි සම්ප්‍රදායික නොවන කර්මාන්ත වෙනුවෙන් වැඩි ආයෝජන ප්‍රමාණයක් කර තිබීම කැපී පෙනෙන ලක්ෂණයකි. මෙම යෝජනා ක්‍රමය යටතේ 1996 දෙසැම්බර් මස අවසානය වනවිට ව්‍යවසායයන් 120 ක් මගින් රුපියල් දශ ලක්ෂ 3600 ක් වටිනා උපකරණ ආනයනය කර ඇත.

අපනයනය පදනම් කරගත් කර්මාන්ත සඳහා දැනට ලබා දී ඇති දිරිදීම් සම්බන්ධයෙන් වූ යෝජනා ක්‍රමය 1997 අයවැය මගින් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල සහභාගිත්වය යෝජනාක්‍රමය තුළ වැඩිකිරීමේ සහ ඒවායේ අන්තර්ජාතික තරගකාරිත්වය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තද ඇතුලත්වන පරිදි පුළුල් කරන ලදී. මෙම යෝජනා යටතේ, නිෂ්පාදනයෙන් සියයට 90 කට වැඩියෙන් අපනයනය කරන අපනයනකරුවන්ට ප්‍රාග්ධන හා අන්තර් භාණ්ඩ ආනයනය සඳහා ලබා දී ඇති සියයට සියයක තීරුබදු සහ බදු නිදහස් කිරීම්, වෙනුවට නිෂ්පාදනයෙන් සියයට 50 කට වැඩියෙන් අපනයනය කරන අපනයනකරුවන්ට සියයට සියයක තීරු බද්ද සහ බදු නිදහස් කිරීමක්ද, නිෂ්පාදන්යෙන් සියයට 25 - 50 ක් අතර ප්‍රමාණයක් අපනයන කරන අපනයනකරුවන් වෙනුවෙන් සියයට 50 ක නිදහස් කිරීමක් ද ලබා දීමට යෝජනා කරන ලදී. නව ආයෝජනයන් කිරීම දිරි ගැන්වීම සහ උසස් තාක්ෂණ දිරි ගැන්වීම් යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ නොලත් දැනට කර්මාන්ත පවත්වා ගෙන යන ආයෝජකයින් උනන්දු කරවීම යන අරමුණු යටතේ 1998 මාර්තු මාසයට ප්‍රථම නව යන්ත්‍ර සූත්‍ර සහ උපකරණවල ආයෝජනයන් කරනු ලබන, පුද්ගලයින්, හවුල් ව්‍යාපාර හෝ සමාගම් වලට රජය විසින් සියයට 75 ක බදු සහනයක් ප්‍රදානය කරන ලදී. මෙම බදු සහනය තක්සේරු වර්ෂයේ තක්සේරු ආදායමෙන් සියයට 50 ක උපරිම සීමාවකට යටත් වන අතර, මෙම සහනය ඉදිරි වර්ෂය සඳහා ද ගෙන යාමට හැකියාව ඇත. මෙම විශේෂිත කාලය තුල කරන ලද ආයෝජනය රුපියල් දශ ලක්ෂ 250 ට වැඩි නම් හෝ තෝරාගත් දියුණුවෙන් අඩු ප්‍රදේශවල ආයෝජනයන් කරනු ලබන්නේ නම් තක්සේරු ආදායමෙන් සියයට 75 ක උපරිමයකට යටත්ව සියයට සියයක බදු සහනයක් සලසා දී ඇත.

කර්මාන්ත අංශයට තවදුරටත් දිරිදීම් ලබාදීම සඳහා යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ වෙනුවෙන් දැනට ලබාදී ඇති සියයට 33 1/3 ක් වන ක්ෂයවීම් ප්‍රතිශතය, ආයෝජකයින්ට මෙවැනි උපකරණ මිලදී ගැනීම සඳහා වැය වන මුළු පිරිවැය අවුරුදු දෙකක් ඇතුලත කපා හැරිය හැකි වන පරිදි සියයට 50 දක්වා වැඩි කරන ලදී. 1996 බදු යෝජනා මගින් සියයට 4.5 සිට සියයට 2 දක්වා අඩු කරනු ලැබූ යන්ත්‍ර සහ උපකරණ වෙනුවෙන් වූ ජාතික ආරක්ෂක බද්ද, ආයෝජන පිරිවැය අඩුකරලීම සඳහා සියයට .05 දක්වා තවදුරටත් අඩු කරන ලදී. ආයෝජන මණ්ඩලය යටතේ වන ආයතන වලට මෙන්ම ආයෝජන මණ්ඩලය යටතේ නොපවතින ආයතන වලටද මූල්‍ය පහසුකම් වාසිදායක අන්දමින් උපයෝගී කර ගැනීමට හැකිවනු පිණිස විදේශීය මුදලින් ණය ගැනීමට අවසර දෙන ලදී.

ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මකව පවතින ව්‍යවසායයන් සඳහා දැනට ලබාදී ඇති සහන වලට අමතරව යන්ත්‍ර සහ උපකරණ සඳහා අවම වශයෙන් රුපියල් දශලක්ෂ 50 කට වැඩියෙන් ආයෝජනය කරනු ලබන සහ රැකියා අවස්ථාවන් 50 කට වඩා සලසන ආයෝජන මණ්ඩලයට අයත් ආනයනය මත යොමු වූ කර්මාන්ත වලට 1996 අයවැය මගින් වසර 5 ක බදු විරාමයක් ලබා දුනි. ආයෝජනය කරනු ලබන ප්‍රමාණය සහ අළුතින් ඇතිකරනු ලබන රැකියා අවස්ථාවන් පදනම් කරගෙන යටිතල පහසුකම් සැලසීම් ද ඇතුළත් මහා පරිමානයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවුරුදු 10-20 දක්වා වූ බදු විරාමයක් ලබා දී ඇති අතර මෙම සමාගම් ආනයන අපනයන පාලන සහ කොටස් හුවමාරු කිරීමේදී උද්ගතවන ප්‍රාග්ධන ලාභ වලින් ආදායම් බදු නිදහස් කිරීම් ලබාගැනීමට සුදුසුකම් ලබනු ඇත. මෙම කාණ්ඩය යටතේ වන අපනයන පදනම් කරගත් ව්‍යාපෘතීන් මගින් එම ව්‍යාපෘතිවල මුළු ජීවිත කාලය තුළම එම ව්‍යාපෘතිය හා සම්බන්ධිත යන්ත්‍ර, උපකරණ, අමුද්‍රව්‍ය යනාදිය තීරුබදුවලින්, පිරිවැටුම් බදු වලින් සහ නිෂ්පාදන බදුවලින් නිදහස්ව ආන්යනය කිරීමට අවසර දී ඇත.

## කර්මාන්තවල ශ්‍රම ඵලදායිතාවය

විදුලිය කැපීම නිසා නිෂ්පාදනයට බාධා ඇති වුවද නිෂ්පාදකයින් සේවා නියුක්ති මට්ටම් උපරිම අයුරින් පවත්වාගෙන යෑම නිසා ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තවල ශ්‍රම ඵලදායිතාව මිනිස් පැයක් සඳහා වූ මූර්ත එකතු කළ අගය, 1996 වර්ෂයේදී සියයට 1.1 කින් අඩු වී ඇත. 1995 වර්ෂයේ සියයට 10.2 ක් වූ කර්මාන්තවල මූර්ත එකතු කළ අගයේ වර්ධනය මෙම වර්ෂයේ සියයට 7.3 දක්වා අඩුවුවද ශ්‍රමික සංඛ්‍යාව අඩුවූයේ සියයට 1.7 කින් පමණි. මෙය ශ්‍රමික ඵලදායිතාවය අඩුවීමට හේතු විය. නිෂ්පාදන ආයතන වලින් බොහොමයක ශ්‍රම ඵලදායිත්වය අඩුවීම සහ ලාභදායිත්වය අඩුවීම අතර ඇත්තේ ධන සම්බන්ධතාවයකි. කෙසේ වෙතත් මෙම තත්වය විවිධ කර්මාන්ත අතර වෙනස් වූ අතර, ආහාර, පාන සහ දුම්කොළ (සියයට 4), දැව හා දැව නිෂ්පාදන (සියයට 3.7), රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ (සියයට 5.2), මූලික ඛනිජ නිෂ්පාදන (සියයට 4.3) සහ ඛණිජ නොවන ලෝහ නිෂ්පාදන (සියයට 4.4) යන කාණ්ඩවල ශ්‍රම ඵලදායිතා වර්ධනයක් දක්නට ලැබුණි.

සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ දියුණු තාක්ෂණ ක්‍රම භාවිතා කිරීම මගින් නිෂ්පාදන ඵලදායිතාවය වර්ධනය වේ. නිෂ්පාදන

ඵලදායිතාවය ඉහළ නැංවීම හදිසි අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන තිබුනද එය කෙටි කාලසීමාවක් තුළ ළඟා කරගත නොහැකි බැවින් 1997 - 2006 දක්වා කාලය "නිෂ්පාදන ඵලදායිතා දශකය" ලෙස රජය විසින් ප්‍රකාශයට පත්කොට ඇත. මේ අනුව නිෂ්පාදකයන්, සේවකයන් සහ මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත. මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරන කර්මාන්ත සංවර්ධන මණ්ඩලය නිෂ්පාදන ඵලදායිතා සංකල්පය භාවිතය සහ ප්‍රයෝජන සම්බන්ධයෙන් මාධ්‍යකරුවන්, ව්‍යාපාර ප්‍රධානීන්, ආයතන විධායක නිළධාරීන්, වෘත්තිය සමිති නායකයින්, රාජ්‍ය නොවන සංවිධාන වෘත්තිකයන් සහ පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා පුහුණු සැසි, වැඩමුළු, රැස්වීම් සහ දේශන මාලාවක් සංවිධානය කොට ඇත. එමෙන්ම අමාත්‍යාංශය මගින් නිෂ්පාදන ඵලදායිතා කටයුතුවලට මග පෙන්වීම සහ අධීක්ෂණය සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් සහ නිෂ්පාදන ඵලදායිතා කාර්යාංශයක් පිහිටුවා ඇත. මීට අමතරව මේ සඳහා රජය මගින් පෞද්ගලික අංශය හා ඒකාබද්ධව "කුසලතා සංවර්ධන අරමුදල" නමින් අරමුදලක් පිහිටුවීමට කටයුතු යොදා ඇත.

## කාර්මික ශ්‍රමික සම්බන්ධතා සහ ශ්‍රම ඵලදායිතාව

හිතකර කම්කරු සබඳතා සහ ශ්‍රම ඵලදායිතා වර්ධනය, කාර්මික අංශයේ නිෂ්පාදනය කෙරෙහි බලපාන තීරණාත්මක සාධකයන් බැවින් ශ්‍රී ලංකා මහ බැංකුව සේවක ප්‍රශ්න සම්බන්ධයෙන් සේවානියුක්තිකයන්ගේ අදහස් ලබා ගැනීම සඳහා මෑතකදී සමීක්ෂණයක් කරන ලදී. ඉහත සමීක්ෂණයෙන් සහ කම්කරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු වලට අනුව කාර්මික අංශයේ සේවක වැඩ වර්ජන 1994 වර්ෂයේදී ඉහළ මට්ටමක පැවතුනත් 1995 වර්ෂයේදී එම ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබේ. එසේ වුවද, වැඩ වර්ජන සංඛ්‍යාව 1995 වර්ෂය තුළ ඉහළ මට්ටමක පැවතුණි. මෙම සමීක්ෂණයට ප්‍රතිචාරය දැක්වූ නිෂ්පාදකයින්ගෙන් අඩක් පමණ සේවක සේව්‍ය සබඳතා වැඩිදියුණු වී ඇති බව සඳහන් කිරීම කර්මාන්ත අංශයේ වර්ධනය දිරි ගන්වන සුළු ලක්ෂණයක් වෙයි.

පැවති වැඩ වර්ජනවලට සම්බන්ධ ප්‍රධාන ඉල්ලීම් වී ඇත්තේ වැඩි වැටුප් සහ වැඩි මූල්‍ය ප්‍රතිලාභයන්ය. ඒ අනුව මෙම වැඩවර්ජන නිෂ්පාදන අංශයේ පිරිවැය මට්ටම වැඩි කිරීමට හේතු වී ඇත. ඉහත ඉල්ලීම්වලට අමතරව වැඩ වර්ජනයන්ට හේතුවී ඇති අනෙකුත් ඉල්ලීම් අතර සේවකයිනගේ ස්ථාන මාරුවීම්, සේවකයන්ගේ වැඩ තහනම් කිරීම්, සේවකයින්ට විරුද්ධ විනයානුකූල ක්‍රියාමාර්ග, සේවක අර්ථසාධක/ සේවක භාරකාර අරමුදල්වලට සම්බන්ධ ගැටළු සහ වෙනත් වැඩ වර්ජනවලට සහයෝගය පළ කිරීම් ප්‍රධාන තැනක් ගනියි.

මෙම වර්ජනවල ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදන ප්‍රමාණය අහිමි වීමට අමතරව, නිෂ්පාදන ආයතනවල ස්ථාවර ගැනුම්කරුවන් කොටසක් අහිමිවීම, විකුණුම් ප්‍රමාණ පහත වැටීම, අමුද්‍රව්‍ය අපතේ යෑම සහ අපනයන ඉපැයුම් පහත වැටීම්ද සිදු විය. මීට අමතරව ඇතැම් අවස්ථා වලදී සැලකිය යුතු ප්‍රමාණයක රැකියා අවස්ථාවන් අහිමි වීම් ද ඇතිවී තිබේ.


සේවා යෝජකයින් බහුතරයකගේ අදහස වනුයේ සේවක සේව්‍ය දෙපාර්ශවයේම යුතුකම් සහ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් බව සහ සේවක සේව්‍ය දෙපාර්ශයයේ වගකීම් හා කාර්යභාරයන් පිළිබඳ දැනුවත් කිරීම යහපත් සේවක සේව්‍ය සබඳතා වර්ධනයකට හේතුවන බවය.

ආයතන බොහොමයක් ශ්‍රම ඵලදායිතා වර්ධනය කිරීම සඳහා පියවර රැසක් ගෙන ඇතත් මෑත කාලයේ ශ්‍රම ඵලදායිතා වර්ධනය වී ඇති බව වාර්තා කර ඇත්තේ සමීක්ෂණයට භාජනය කළ ආයතන වලින් අඩක පමණි. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල වලට අනුව ශ්‍රම ඵලදායිතාවය යහපත් නොවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සේවකයින්ගේ ආකල්ප, සේවක


රූප සටහන 4.5

ශ්‍රම ඵලදායිතා දර්ශකය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන ආයතන වල මිනිස් පැයක එකතු කළ අගය

රූප සටහන 4.5.1




රූප සටහන 4.5.2



සංඛ්‍යා සටහන 4. 13

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදායිතා දර්ශකය (අ)**

(1995=100)

| කාණ්ඩ | මිනිස් පැයක එකතු කළ අගය | | 1996 දී ඵලදායිතාවය | |
|---|---|---|---|---|
| | 1995 | 1996 (ආ) | % වෙනස | දර්ශකය (1995=100) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 342.8 | 356.6 | 4.0 | 104.0 |
| 2. රෙදිපිළි, ඇගළුම් සහ සම් නිෂ්පාදිත | 56.4 | 55.8 | -1.1 | 98.9 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 56.5 | 58.6 | 3.7 | 103.7 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 154.6 | 152.6 | -1.3 | 98.7 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 123.6 | 130.0 | 5.2 | 105.2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හැර) | 72.9 | 76.1 | 4.4 | 104.4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 139.5 | 145.5 | 4.3 | 104.3 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 100.5 | 97.5 | -3 | 97.0 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | | | | |
| | 57.5 | 59.9 | 4.2 | 104.2 |
| එකතුව | 99.7 | 98.6 | -1.1 | 98.9 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 160 කින් ලැබ ඇති තොරතුරු මත පදනම්වී ඇත.
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආචාර ධර්ම පිරිහීම, නොඉවසිලිමත් බව, දිගුකාලීන ඵලදායිතා අරමුණු සාක්ෂාත් කර ගැනීමට කැප නොවීම, අභිප්‍රේරණය නොමැතිවීම, කම්කරු නීතිවල පවතින අඩුපාඩුකම්, පොදු ප්‍රවාහණ පහසුකම්වල පවතින දුර්වලතාවයන්, නේවාසික පහසුකම් නොමැතිවීම සහ දේශපාලන ඇඟිලිගැසීම් වේ. මේ අනුව කර්මාන්ත ආයතනවල නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීමේ උපාය මාර්ග ලෙස, නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම සහ සේවක වැටුප් වැඩිකිරීම අතර අන්තර් සම්බන්ධයක් ඇති කිරීම, නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම නිසා ශ්‍රමිකයන්ට ලබා ගත හැකි ප්‍රතිලාභ සම්බන්ධව ඔවුන් දැනුවත් කිරීම, සේවක ආචාරධර්ම වැඩිදියුණු කිරීම, ඵලදායී පුහුණු වැඩසටහන් ඇති කිරීම, ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සහ නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම ප්‍රධාන යෝජනාවන් ලෙස ඉදිරිපත් කර ඇත.

## 4.8 කර්මාන්ත ස්ථානගතවීම

කර්මාන්ත බොහොමයක් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි කේන්ද්‍රගතව පැවතුණි. කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති කර්මාන්තශාලා 1,637 න් සියයට 87 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ස්ථානගතවී තිබුණි. ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වගන්ති යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යවසායකයන් 979 සම්බන්ධව බලන විට සියයට 78 ක් මෙම දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටා ඇත. (උපලේඛණ සංඛ්‍යා සටහන 25) ප්‍රාදේශීය කාර්මිකකරණය නගා සිටුවීමේ අවශ්‍යතාවය බලයට පත් රජයයන් විසින් හඳුනා ගත් අතර, මෑතක දී කර්මාන්ත ප්‍රාදේශීයකරණය සඳහා දැඩි උත්සාහයක් ගන්නා ලදී. මේ අතර, ඇගළුම් කම්හල් 200 වැඩසටහන, කොග්ගල අපනයන සැකසුම් කලාපය සහ පල්ලෙකැලේ කර්මාන්ත පුරය වැදගත් තැනක් ගනී. වත්මන් පාලනය යටතේ ප්‍රාදේශීය කර්මාන්ත පුර ප්‍රවර්ධනය, දකුණු පළාත් සංවර්ධන යෝජනා ක්‍රමය, ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීම, සමස්ත සංවර්ධන උපාය මාර්ගවලට ඇතුළත් වේ. 1997 අයවැය යෝජනා මගින් දුෂ්කර ප්‍රදේශයන්හි කර්මාන්ත සඳහා බදු දිරිගැන්වීම් ප්‍රකාශ කර ඇත.

ස්ථාන කිහිපයක කර්මාන්තයන් බෙහෙවින් කේන්ද්‍රගතව පැවතීම හේතුවෙන්, සෞඛ්‍යය, පරිසර දූෂණය ආදිය සම්බන්ධව ඇතිවන ගැටළු සහ තදබදය අඩුකිරීම සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථාන වල අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම තුළින් ඌන සංවර්ධිත ප්‍රදේශයන්හි කාර්මික කටයුතු නැංවීමේ අදහසින් 1995 දී කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන දියත් කරන ලදී. මෙම වැඩසටහන යටතේ අක්කර 1,700 ක් ආවරණය වන අතර, මෙයට සීතාවක සහ කළුතර ජාත්‍යන්තර මට්ටමේ කර්මාන්තපුර දෙකක් සහ වෙනත් ප්‍රදේශවල ඇතිකිරීමට අපේක්ෂිත කර්මාන්තපුර 23 ක් ද ඇතුළත් වේ.

සීතාවක කර්මාන්තපුරයට අදාළ සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් කිරීම් 1996 දී සම්පූර්ණ කරන ලදී. ගුවන්තොටුපොළ ප්‍රසාරණය කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් කටාන ප්‍රදේශයේ පිහිටුවීමට බලාපොරොත්තු වූ වැඩබිම අතහැර දැමීමට සිදුවූ අතර, ඒ වෙනුවට කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රදේශයක් තෝරා ගෙන ඇත. 1996 දී මූලික විමර්ශණ කටයුතු පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයන් සහ ඉඩම් පවරා ගැනීමේ කාර්‍යයන් ආරම්භ විය. කර්මාන්තපුර නවය හා සම්බන්ධව ඉංජිනේරු සැලසුම් කිරීම්, මූලික යටිතල පහසුකම් සැලසීම සහ භෞතික සංවර්ධන කටයුතු ද 1996 දී ආරම්භ කරන ලදී. 1996 දී පුත්තලම දිස්ත්‍රික්කයෙහි පිහිටුවන ලද දංකොටුව කර්මාන්තපුරයට අදාල සංවර්ධන වැඩකටයුතු සම්පූර්ණ කරන ලද අතර, කර්මාන්තකරුවන් අතරේ කර්මාන්ත පිහිටුවීම සඳහා ඉඩම් කැබලි බෙදා දෙන ලදී.

කුසලතා සංවර්ධන වැඩසටහනට අමතරව ප්‍රාදේශීය කර්මාන්තකරණය සාර්ථකව ක්‍රියාත්මක කළහැකි වනුයේ පැහැදිළි සංවර්ධන වැඩසටහනකට අමතරව, මාර්ග, දුරකථන පහසුකම්, ගුවන් තොටුපොල සහ වරාය වැනි සමස්ත යටිතල පහසුකම් තුළ නිසියාකාරව ඒකාබද්ධ වර්ධනයක් තුළින් පමණි. මේවායින් සමහරක් ඉදිකර පවත්වාගෙන යාමේ හෝ ඉදිකර පවරා දීමේ ක්‍රමය යටතේ (BOO/BOT) කළ හැකිය. කෙසේ වුව ද, ආධාර සපයන රටවල හා ආයතනවල සහය ලබාගැනීම සඳහා රජයේ මැදිහත්වීමකින් තොරව මහා පරිමාණයේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනක් දියත් කළ නොහැකි ය. මෙය කළයුත්තේ සුදුසු ස්ථානවල ඉදිකර පවත්වාගෙන ගොස් පවරාදීමේ පදනම යටතේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයට අවහිරයක් නොවන අන්දමටය.